දිනය: 2021-08-28
අංකය: 16

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

# මාධ්‍ය නිවේදනයයි
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
# වීසා ගාස්තු සංශෝධනය

අංක 2241/37 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2021 අගෝස්තු මස 18 වන දින ප්‍රසිද්ධ කොට ඇති නව ආගාමික හා විගාමික රෙගුලාසි අනුව වීසා ගාස්තු හා දඩ මුදල් පහත පරිදි සංශෝධනය කර ඇති බව සියලු පුද්ගලයන්ගේ දැන ගැනීම සඳහා දන්වා සිටිමි.

අතිවාසය සඳහා දඩ මුදල්

- ශ්‍රී ලංකාව තුළ වීසා නොමැතිව හෝ වීසා කාලය ඉක්මවා රැඳී සිටීමට වීසා ගාස්තුවට අමතරව ඇමරිකානු ඩොලර් 500 ක් අය කරනු ලබයි.

13 නියෝගය අනුව නව වීසා ගාස්තු

| | වීසා වර්ගය | ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් (US $) (වසරකට හෝ ඉන් කොටසකට) |
|---|---|---|
| 1 වාස වීසා | (i) ආයෝජකයන් සඳහා<br>(ii) සේවා නියුක්තිකයන් සඳහා<br>(iii) ශිෂ්‍යයන් සඳහා<br>(iv) වෛද්‍ය ප්‍රතිකාර ලබන තැනැත්තන් සඳහා<br>(v) රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරන්නන්<br>(vi) ආගමික කටයුතුවල යෙදෙන්නන් සඳහා<br>(vii) ඉහත තැනැත්තෙකුගේ කලත්‍රයා සඳහා<br>(viii) ඉහත තැනැත්තෙකුගේ යැපෙන දරුවන්ගෙන් අයකුට | 200 |
| 2 වාස වීසා | (i) පුරවැසි පනතේ 19, 20 හෝ 21 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අවසන් වූ යම් තැනැත්තෙකුට<br>(ii) ඉහත තැනැත්තෙකුගේ කලත්‍රයා සඳහා<br>(iii) ඉහත තැනැත්තෙකුගේ යැපෙන දරුවන්ගෙන් අයකුට | 100 |
| 3 වාස වීසා | (i) 1967 අංක 14 දරන ඉන්දු - ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ 13 වන වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තෙකු සඳහා<br>(ii) ඉහත තැනැත්තෙකුගේ කලත්‍රයා සඳහා<br>(iii) ඉහත තැනැත්තෙකුගේ යැපෙන දරුවන්ගෙන් අයකුට | 100 |
| 4 වාස වීසා | පූජ්‍ය පක්ෂයේ අයකු සඳහා | නිදහස් |
| 5 වාස වීසා | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වූ විදේශීය කලත්‍රයාට<br>(ii) ශ්‍රී ලාංකික නොවන කලත්‍රයාගේ යැපෙන දරුවන්ගෙන් අයකුට | නිදහස් |

| | | | |
|---|---|---|---|
| 6 වාස වීසා | මියගිය ශ්‍රී ලාංකිකයකුගේ නැවත විවාහ නොවූ ශ්‍රී ලාංකික නොවන කලත්‍රයාට (සේවා නියුක්ති අවසරය සමඟ) | 100 | |
| 7 වාස වීසා | ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ වසර දහයකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවේ අඛණ්ඩව ජීවත් වන ශ්‍රී ලාංකික නොවන කලත්‍රයාට (සේවා නියුක්ති අවසරය සමඟ) | 100 | |
| 8 වාස වීසා | ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ අවුරුදු දහඅටට අඩු දරුවන් සහිත ශ්‍රී ලාංකීය නොවන කලත්‍රයාට (සේවා නියුක්ති අවසරය සමඟ) | 100 | |
| **පැමිණීමේ වීසා** | **සංචාරක කාර්යය ( Visit – Tourist)** | **මාර්ගගත** | **පැමිණි පසු** |
| | දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) රටවල් සඳහා (විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA) **(පළමු දින 30 සඳහා)** | 20 | 25 |
| | දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයට (SAARC) අයත් නොවන වෙනත් රටවල් (විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA) **(පළමු දින 30 සඳහා)** | 35 | 40 |
| | **<u>පහත නම් කළ රටක් සඳහා</u>** | **මාර්ගගත** | **ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන්** |
| | ඔස්ට්‍රියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, නෙදර්ලන්තය. පෝලන්තය, ඉතාලිය, පින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය, ස්පාඤ්ඤය, ග්‍රීසිය, ස්විඩනය, හංගේරියාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය, ස්විස්ටර්ලන්තය, නොර්වේ, පෘතුගාලය, ස්ලෝවේනියාව, එස්තෝනියාව, මොරිෂස්, අයර්ලන්තය සහ කියුබාව (දින 30 සිට දින 90 දක්වා) | 100 | 100 |
| | ඇමරිකා එක්සත් ජනපදය සඳහා (දින 90 පසු දින 180 දක්වා) | - | නිදහස් |
| | සිංගප්පූරුව, මාලදිවයින, සීෂෙල්ස් සහ චෙක් සමූහාණ්ඩුව සඳහා (දින 30 සිට දින 90 දක්වා) | - | නිදහස් |
| | ඉහත නම් කළ රටක්, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මාලදිවයින, සීෂෙල්ස් සහ චෙක් සමූහාණ්ඩුව හැර වෙනත් යම් රටක් සඳහා (දින 30 සිට දින 90 දක්වා) | - | 60 |
| | ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා (දින 90 සිට දින 180 දක්වා) | - | 150 |
| | ඕනෑම රටක් සඳහා (දින 180 සිට දින 270 දක්වා) | - | 200 |

| | ව්‍යාපාරික කාර්යය ( **Visit – Business)** | මාර්ගගත | පැමිණි පසු |
|---|---|---|---|
| | දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) අයත් රටවල් සඳහා (විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA)<br>**(පළමු දින 30 සඳහා)** | 30 | 40 |
| | දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) අයත් නොවන රටක් සඳහා<br>(විද්‍යුත් සංචරණ අනුමැතිය - ETA)<br>**(පළමු දින 30 සඳහා)** | 40 | 50 |
| | ඇමරිකා එක්සත් ජනපදය සඳහා<br>(දින 30 සිට දින 180 දක්වා)<br>**ව්‍යාපාරික කාර්යය සඳහා වන වීසා** දීර්ඝ කල හැක්කේ ප්‍රධාන කාර්යාලයෙන් පමණි. | 100 | |
| | ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා<br>(දින 30 සිට දින 90 දක්වා)<br>**ව්‍යාපාරික කාර්යය සඳහා වන වීසා** දීර්ඝ කල හැක්කේ ප්‍රධාන කාර්යාලයෙන් පමණි. | 100 | |
| | ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා<br>(දින 90 පසු සහ 180 දක්වා)<br>**ව්‍යාපාරික කාර්යය සඳහා වන වීසා** දීර්ඝ කල හැක්කේ ප්‍රධාන කාර්යාලයෙන් පමණි. | 200 | |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ https://eservices.immigration.gov.lk/vs දරන වෙබ් අඩවියට පිවිස දින 30 ට පසු සංචාරක වීසා දීර්ඝ කිරීමට හැක. | | | |
| මාර්ගස්ථ වීසා | සියලු රටවල් සඳහා | නිදහස් | |

සම්පූර්ණ තොරතුරු පරිශීලනය සඳහා පහත දිගුව මගින් 2241/37 දරන අති විශේෂ ගැසට් පත්‍රය භාගත කර ගන්න.

http://documents.gov.lk/files/egz/2021/8/2241-37_S.pdf

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව